 ISSN 2362-0412

## ආඛ්‍යාන කාව්‍යයෙහි කථාවින්‍යාසය පිළිබඳ ඇරිස්ටෝටලියානු විග්‍රහයක් (ගුත්තිල කාව්‍යය ඇසුරෙන්)

N.E.H. Lanka

*Department of Sinhala, Faculty of Humanities and Social Sciences, University of Ruhuna, Sri Lanka*

Corresponding author: hasini.lanka@gmail.com

කවිය මාධ්‍ය කරගනිමින් කිසියම් කථාවක් කලාත්මකව ගොඩනැගීම ආඛ්‍යාන කාව්‍ය වශයෙන් හැඳින්වේ. ආඛ්‍යාන යන පදය බටහිර ‘Narrative’ පදය ආශ්‍රය කොටගෙන බිහි වන්නකි. ආඛ්‍යාන කාව්‍යයෙහි සන්දර්භමය ගති ලක්ෂණ පිරික්සීමේදී හුදෙක්ම කාව්‍යමය ලක්ෂණ පමණක් නොව නාට්‍යමය, ප්‍රබන්ධමය ගති ලක්ෂණද ඒ කෙරෙන් විද්‍යමානිතය. කථාවින්‍යාසය යනු සංවිධානාත්මකව සකසන ලද සිද්ධිදාමයකි. ඇරිස්ටෝටලියානු විග්‍රහයේදී කථාවින්‍යාසය යන්න පැහැදිලි කරනුයේ ශෝකෝත්පාදකය (Tragedy) ආධාරවය. ඇරිස්ටෝටල් විසින් නාට්‍යමය ශෝකෝත්පාදකයෙහි අන්තර්ගත විය යුතු අංග හයක් දක්වනු ලබයි. එනම් කථාවින්‍යාසය, චරිත, වාග්විලාසය, චින්තනය, ප්‍රේක්ෂාව සහ සංගීතය යන්නයි. එමෙන්ම ඇරිස්ටෝටල් විසින් ස්වීය කාව්‍ය ශාස්ත්‍රය කෘතියෙහි (Poetics) කථාවින්‍යාසයට ප්‍රමුඛ ස්ථානයක්ද චරිත නිරූපණයට ද්විතීය ස්ථානයද ලබා දී ඇත. කෝට්ටේ අවධියෙහි ලියවෙන ගුත්තිල කාව්‍ය වනාහි ඇරිස්ටෝටලියානු ශෝකෝත්පාදකයක් නොවුණද, ගුත්තිල ජාතකයෙහි දැක්වෙන කර්ම සංකල්පයෙන් පරිබාහිරව, කථාවින්‍යාසය ආශ්‍රිත ඇරිස්ටෝටලියානු විග්‍රහයන්ට අනුකූලව ගැඹුරු කියවීමකට ලක් කළ හැකි නිර්මාණයකි. සම්භාව්‍ය පද්‍ය සාහිත්‍යයෙහි බොහෝ ආඛ්‍යාන කාව්‍යවල සිද්ධි ගැළපීමේ අනෞචිත්‍යය සම්බන්ධ විවිධ මතවාද පැවතියත් ගුත්තිල කාව්‍යයෙහි සංවිධානාත්මක ස්වරූපය බහුතරයකගේ ඇගයුමට පාත්‍රව තිබේ. මෙම අධ්‍යයනයේදී සිදු වූයේ ගුත්තිල කාව්‍ය නමැති සම්භාව්‍ය ආඛ්‍යාන පද්‍යයෙහි කථාවින්‍යාසයෙහි පවතින ශිල්පීය ලක්ෂණ ඇරිස්ටෝටලියානු සෞන්දර්ය න්‍යායන්ට අනුව විශ්ලේෂණය කර බැලීමකි. බටහිර සාහිත්‍ය විචාරයත් සම්භාව්‍ය පද්‍ය සාහිත්‍යයත් මෙහි අධ්‍යයන ක්ෂේත්‍ර විය. ඇරිස්ටෝටලියානු න්‍යායෙහි දැක්වෙන කථාවින්‍යාසයෙහි අංග ලක්ෂණ ගුත්තිල කාව්‍ය කෙරෙන් නිරූපණය වනුයේ කෙලෙසද යන්න මෙම පර්යේෂණයේ අධ්‍යයන ගැටලුව වුණි. අපරදිග සාහිත්‍ය විචාරයත් සම්භාව්‍ය පද්‍ය සාහිත්‍යයත් ආශ්‍රිත තුලනාත්මක අධ්‍යයනයක් සිදු කිරීම, කථාවින්‍යාසය භාවිතයෙහිලා ඇරිස්ටෝටලියානු න්‍යාය පැහැදිලි කිරීම සහ ගුත්තිල කාව්‍යයෙහි මුල, මැද, අග යන ත්‍රයෙහි විධිමත් ගැළපීම හඳුනාගැනීම මෙම පර්යේෂණයේ අරමුණු විය. මෙහිදී ගුණාත්මක දත්ත ආශ්‍රය කොට ගැනුණු අතර පුස්තකාලය ගවේෂණය සහ අන්තර්ජාලය පරිශීලනය ඔස්සේ දත්ත ගවේෂණය කරනු ලැබුණි. ගුත්තිල මූසිල වාදය, වීණා තරඟ මණ්ඩපය සැකසීම, තරඟය නැරඹීමට පැමිණි මැති ඇමති පිරිස් වර්ණනය, ගුත්තිලගේ වීණා වාදනය අතිශයෝක්තියෙන් වර්ණනය හා ගුත්තිලගේ සුරලොව ගමන යන මෙකී සියලු සිද්ධිවල මනා අවයව සංස්ථාපනයක් පවතී. ඇරිස්ටෝටලියානු න්‍යායෙහි දැක්වෙන ආකාරයට ‘කාරුණ්‍ය’ වැනි භාව ගුත්තිල කාව්‍යයෙහි කථාවින්‍යාසය ආශ්‍රිතව ගොඩනැගේ. කථාවින්‍යාසයෙහි අන්තර්ගත විය යුතුයැයි ඇරිස්ටෝටල් විසින් දක්වනු ලබන සම්භාව්‍යතාව (Probability), භවිතව්‍යතාව (Possibility) සහ අවශ්‍යතාව (Necessity) යන ලක්ෂණ ගුත්තිල කාව්‍ය කෙරෙන් විශද වන බැව් පර්යේෂණ සමාලෝචනයේදී ගම්‍ය විය.

*ප්‍රමුඛ වචන: ආඛ්‍යාන කාව්‍ය, ඇරිස්ටෝටලියානු න්‍යාය, කථාවින්‍යාසය, ගුත්තිල කාව්‍ය, ශෝකෝත්පාදකය*